**ශීර්ෂය - 001 අතිගරු ජනාධිපති කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 001 අතිගරු ජනාධිපති 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති වැය ශීර්ෂයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

### 2.1.1 ඇස්තමේන්තු පිළියෙල කිරීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 18ක ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගැනීම නිසා මුල් ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට 760 දක්වා ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66/99 මඟින් මාරු කර ගෙන එකතුව රු.448,132,000 ක ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි. | ගරු ජනාධිපතිතුමාගේ 2022 වර්ෂයේ නිල විදේශ ගමන් වියදම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ලිපිද්‍රව්‍ය මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහලයාම, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු වල මිල ගණන් ඉහල යාම, මාණ්ඩලික නිලධාරීන් විසින් ප්‍රවාහන දීමනා ඉල්ලුම් කිරීම, විදුලි හා ජල බිල්පත් මිල ගණන් සීඝ්‍රයෙන් ඉහල යාම, කාර්යාල පරිශ්‍රය වැඩිදියුණු කිරීම සඳහා පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල ගණන් සීඝ්‍රයෙන් ඉහලයාම, වාහන අමතර කොටස්වල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහලයාම, ජනාධිපති කාර්යාලය අවට ආරක්ෂිත වැට නැවත ඉදිකිරීමට සිදු වීම හා ගෘහභාණ්ඩ කාර්යාලීය උපකරණ මිල ගණන් අපේක්ෂිත ඇස්තමේන්තු ඉක්මවා යාම, හිටපු ජනාධිපති වැන්දඹු භාර්යාව සඳහා වාහන වැඩිදියුණු කිරීම වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත්, හිටපු ජනාධිපතිවරුන්ට අවශ්‍ය පහසුකම් හා වාහන වැඩිදියුණු කිරීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් නිසා අතිරික්ත ප්‍රතිපාදන සහිත වැය විෂයකින් මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර අවශ්‍ය වියදම් දරන ලද බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සිදු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (ආ) වැය විෂයයන් 02 ක එකතුව රු.20,000,000 ක අයවැය ඇස්තමේන්තුවට අමතරව මු.රෙ.66/69 යටතේ සිදු කළ මාරු කිරීම් තුළින් වැය විෂයයන් දෙක සඳහා එකතුව රු.16,925,000 කින් ප්‍රතිපාදනය වැඩිකරගෙන තිබුණ ද, වියදම රු.19,089,696 ක් වූයෙන් මූල් ඇස්තමේන්තු ප්‍රතිපාදනය හෝ වියදම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම වැය විෂයන් දෙක අතිගරු ජනාධිපතිතුමන්ගේ විෂය පථයට ගැනෙන ඇතැම් කරුණු සහ අවශ්‍යතා, ඉතා හදිසි වූත්, කල් දැමිය නොහැකි වූත් කරුණු වන බැවින් ඒවා එම අවස්ථාවේදීම ඉටු කිරීමට සිදුවන බැවිනි. එවැනි අවස්ථාවලදී පසුව ප්‍රතිපාදන ලබාගෙන පියවීමේ පදනම මත හෝ ඊළඟ වර්ෂයේ ප්‍රතිපාදනවලින් වියදම් දැරීමේ පදනම මත අදාල සේවාව ඉටු කරගැනීමට සිදුවන බව දන්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සිදු කළ යුතුවීම. |

### 2.1.2 ප්‍රතිපාදන උපයෝජනය කිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් දෙකක පිළිවෙලින් රු.1,000,000 ක හා රු.300,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වැය කිරීමකින් තොරව සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹු භාර්යාව සඳහා පහසුකම් සැපයීමට ඉහත ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත් අදාළ පාර්ශව වෙතින් ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව හා ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් සිදු කරන ලද සීමා හේතුවෙන් අපේක්ෂිත පරිදි වියදම් පැන නොනැගීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සිදු කළ යුතුවීම. |
| (ආ) වැය විෂයයන් 12 ක එකතු වටිනාකම රු.388,396,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 93 ත් අතර ප්‍රමාණයක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66/69 මඟින් මාරු කර තිබුණි. | අපේක්ෂිත පරිදි වියදම් ජනනය නොවීම, බදු කුලී මත භාවිතා කරන ලද ගොඩනැගිලි නැවත භාර දීම, හිටපු ජනාධිපතිවරයකු සඳහා වූ ප්‍රතිපාදන වලින් අපේක්ෂිත පරිදි ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, හිටපු ජනාධිපති වැන්දඹු භාර්යාව සඳහා ප්‍රතිපාදනවලින් අපේක්ෂිත පරිදි ඉල්ලීම් ඉදිරිපත් නොවීම, ජනාධිපති කොමිෂන් සභා සඳහා ප්‍රතිපාදන වලින් අපේක්ෂා කල පරිදි වියදම් පැන නොනැගීම, ජාතික | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සිදු කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සඳහා ප්‍රතිපාදන වලින් අපේක්ෂා කල පරිදි වියදම් පැන නොනැගීම හා ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව ගොඩනැගිලි ඉදිකිරීම් නැවැත්වීම ආදී හේතූන් නිසා ඉතිරි වූ ප්‍රතිපාදන ඌන වැය විෂයන් වෙත මාරු කරන ලද බව දන්වා තිබුණි. | |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම, සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම, සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර එම නිලධාරියාට ඉහත කටයුතු | 2020 වසරේ සිට පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වයත්, රට වසා තැබීම හා රාජ්‍ය ආයතනයන්හි කාර්යභාරය අවම සේවක සංඛ්‍යාවක් මත පවත්වාගෙන යාමත්, 2021 සහ 2022 වර්ෂය තුළ රටේ පැවති සීමාකාරී තත්ත්වයන් මත සේවකයන් චක්‍රීය ක්‍රමයන්ට සේවයට කැඳවීමත් හා ජනාධිපති ලේකම් කාර්යාලය කේන්ද්‍ර කරගනිමින් පැවැති අරගල ක්‍රියාමාර්ගද නිසා අත්‍යාවශ්‍ය සේවා කටයුතු අවම සේවක සංඛ්‍යාවක් මඟින් පවත්වා ගෙන යාමත් පුහුණු වැය ශීර්ෂය යටතේ වූ සියලුම ප්‍රතිපාදන පුහුණු කිරීම් සඳහා වැය කිරීමට නොහැකි වී ඇති බවත් යථෝක්ත චක්‍රලේඛයේ 6.1 හා 6.3 පරිදි ආයතනයේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් හිමි කර දීමටද නොහැකි වී ඇති බවද දන්වා තිබුණි.<br>2023 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඉදිරිපත් කර ඇති බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | පැවරීම චක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණි. | | |
| (ආ) | මු.රෙ. 110 ප්‍රකාරව | හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. | හානි පාඩු ලේඛනය යාවත්කාලින කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එය යාවත්කාලින කිරීමෙන් පසු ඉදිරියේදී විගණනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (ඇ) | මු.රෙ.880, 891(1) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ට අනුව මුදල් රෙගුලාසි 315(1) | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක්, එක් එක් දෙපාර්තමේන්තු වෙහි ප්‍රධාන කාර්යාලයේ වඩාත් මැනවින් වූ අකාරාදි ක්‍රමයට පිළියෙල කොට පවත්වාගෙන යා යුතු වුවත් ජනාධිපති කාර්යාලයේ ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුලත් ඇප ලේඛනයක් පවත්වාගෙන යාමේ කටයුතු මේවන විට ආරම්භ කර ඇති බවත් ඉදිරියේදී එය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයතු කරන බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව ඇප ලබාගෙන ලේඛනගත කළ යුතු වීම. |

## 2.3 තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවස්ථා 42 කදී එකතුව රු.4,537,000 ක තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගෙන කාර්යය නිමවීමෙන් පසුව එකතුව රු.1,878,493 ක් මුදලින් ආපසු පියවා තිබුණ අතර, එය ලබාගත් අත්තිකාරම් මුදලින් සියයට 41.4 ක් බව නිරීක්ෂණය විය. | මෙම අත්තිකාරම් මුදල් විධිමත් අනුමැතියක් යටතේ ලබාගෙන ඇති බවත්, ඇස්තමේන්තු ගත පිරිවැය අනුව මෙම අත්තිකාරම් මුදල ලබාගෙන ඇති අතර ඇස්තමේන්තු ගත පිරිවැයට වඩා අඩු පිරිවැයකින් අදාළ විෂයන් ඉටු කර ගැනීමට හැකිවීම මත ඉතිරි වූ මුදල පියවා ඇති බව දන්වා තිබුණි. | වියදම් නිවැරදිව ඇස්තමේන්තු කර අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 371 (4) පරිදි නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුවද, අවස්ථා 19 කදී එකතුව රු.1,464,120 ක අග්‍රිම මුදලක් ලබාගෙන එම මුදල කිසිදු කාර්යයකට යොදා ගැනීමෙන් තොරව දින 1 සිට 43ක් අතර කාලයක් අත රඳවාගෙන මුළු අත්තිකාරම් මුදලම නැවත මුදලින් පියවා තිබුණි. ඒ අතරින් මුදලින් ලබාගත් රු.50,000 ක අත්තිකාරම් මුදලක් චෙක්පතක් මඟින් පියවා තිබුණු බව ද විගණනයට නිරීක්ෂණය විය. | මෙම අත්තිකාරම් මුදල් විධිමත් අනුමැතියක් යටතේ ලබාගෙන ඇති බවත්, ඇස්තමේන්තු ගත පිරිවැය අනුව මෙම අත්තිකාරම් මුදල ලබාගෙන ඇති අතර අත්තිකාරම් ලබා ගත් කාර්යය අවලංගු වීම හෝ අදාළ විෂය ඉටුකර ගැනීමට අවශ්‍ය නොවීම හේතුවෙන් අත්තිකාරම් මුදල් නැවත පියවීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වීම. |

## 2.4 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම

මේ සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිය ගිය නිලධාරියකුගේ වර්ෂ 4-5 අතර කාලයක සිට හිඟව පවතින ආපදා ණය රු.99,140 ක් හා උත්සව අත්තිකාරම් රු.8,000 ක් වශයෙන් එකතුව රු.107,140 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | මියගිය රියදුරු මහතෙකුගේ 2022.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය රු. 91,140 ක් බවත් හිඟ ණය ශේෂය දැනටමත් ඇපකරුගෙන් අයකරමින් පවතින බවත් මේ වන විට පවතින ණය ශේෂය රු. 84,260 දක්වා අඩු වී ඇති බවද ඔහුගේ හිඟ උත්සව අත්තිකාරම් ශේෂය 2022.12.31 දිනට රු.8,000 කි. උත්සව අත්තිකාරම් ශේෂය ගෙවීමට මියගිය ණයකරුගේ කලත්‍රයා විසින් එකඟවූ බවත් දන්වා තිබුණි. | හිඟ ණය ශේෂයන් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ අය වීමට ඇති අවුරුදු 05 කට වැඩි කාලයක් සිට ඉදිරියට එන පිළිවෙලින් රු.144,768 ක දේපල ණය ශේෂ හා රු.114,655ක ආපදා ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයනොවී පැවතුණි. | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 – 7 වගන්තිය යටතේ තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීම අනුව ණයකරුට හිමිවන විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවත් විශ්‍රාම පාරිතෝෂිකයට අදාල ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් පසු ජර්නල් සටහන් මගින් ණය ශේෂය පියවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 02 හා 15 වගන්ති ප්‍රකාරව අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීමක් සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය බව විශ්රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් දැන්වීම හේතුවෙන් එම කටයුතු සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවත් විශ්‍රාම ගැන්වීමේ කටයුතු සිදු කළ පසු එම සේවක මහතාට ලැබිය යුතු පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් පසු ජර්නල් සටහන් මගින් හිඟ ණය ශේෂය පියවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැඩ තහනම් කරන ලද නිලධාරීන් තිදෙනෙකුට අදාළ වර්ෂ තුනත් පහත් අතර කාලයක සිට ඉදිරියට එන එකතුව රු.257,927 ක ආපදා ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවී නොතිබුණි. | වැඩ තහනම් කර ඇති රියදුරු මහතුන් දෙදෙනාගෙන් 2021.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂයන්හි එකතුව රු.150,786කි. මෙම හිඟ ආපදා ණය ශේෂයන් දෙක මේ වන විටත් ඇපකරුවන්ගෙන් අයකරමින් පවතින අතර දැනට පවතින හිඟ ශේෂය රු.137,614ක් දක්වා අඩු වී ඇති බවත්, වැඩ තහනම් කර ඇති රියදුරු මහතෙකුගේ 2021.12.31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය රු. 107,141ක් රාජ්‍ය සේවයේ නියුතු ණයකරුගේ බිරිඳගෙන් දැනටමත් අයකරමින් පවතින බවත් හිඟ ආපදා ණය ශේෂය රු.96,925.47 දක්වා අඩු වී ඇති බව දන්වා තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 10 දෙනෙකුගෙන් මාස 3, වසර 1ත් 5ත් අතර හා වසර 5 ට වැඩි කාලයක සිට අය නොවී පවතින එකතුව රු.1,054,444 ක හිඟ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවී නොතිබුණි. | ඇපකරුවන්ගේ මාසික වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම, ණය අයකර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපතිතුමා වෙත ඉල්ලීම් කිරීම, ණය අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබීම වැනි ක්‍රියා මාර්ග වලින් ණය ශේෂ අය කිරීමට කටයුතු කරන බව වාර්තා කර තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තම ආයතනය වෙනුවෙන් අනුමත වාර්ෂික අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත මුදල් වර්ෂය වෙනුවෙන්, අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු, අනුමත අයවැය | 2021 සහ 2022 වර්ෂය තුළ රටේ පැවති සීමාකාරී තත්ත්වයන් මත රාජ්‍ය සේවකයන් චක්‍රීය ක්‍රමයන්ට සේවයට කැඳවීමත්, අත්‍යාවශ්‍ය සේවා කටයුතු අවම සේවක සංඛ්‍යාවක් මඟින් පවත්වා ගෙන යාමත් හේතුවෙන් 2022 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට නොහැකි වු අතර 2022 දෙවන අර්ධ වර්ෂය තුල ජනාධිපති කාර්යාලයේ සිදුවු පරිපාලනමය වෙනස්වීම් පසුබිම් කරගෙන නැවත විධිමත් පරිදි අංශ ස්ථාපිත කිරීමට සිදුවිය. ඒ අනුව නව ස්ථාපිත අංශ සම්බන්ධව සැලසුම් සකස් | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අත් මුදල් අවශ්‍යතා සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී කරුණු ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | කිරීම සඳහා මාස කිහිපයක් ගත වු බැවින් 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට නොහැකි වු බව දන්වා තිබුණි. | |

### .1.2 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 13 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වාර්ෂික අයවැය මඟින් වෙන් කළ රු.176,920,000 ක ප්‍රතිපාදනයෙන් රු.149,143,452 ක් වියදම් කර තිබුණ ද, ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | 2021 සහ 2022 වර්ෂය තුළ රටේ පැවති සීමාකාරී තත්ත්වයන් මත රාජ්‍ය සේවකයන් චක්‍රීය ක්‍රමයන්ට සේවයට කැඳවීමත්, අත්‍යාවශ්‍ය සේවා කටයුතු අවම සේවක සංඛ්‍යාවක් මඟින් පවත්වා ගෙන යාමත් හේතුවෙන් 2022 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අවසන් කිරීමට නොහැකි වු අතර 2022 දෙවන අර්ධ වර්ෂය තුල ජනාධිපති කාර්යාලයේ සිදුවූ පරිපාලනමය වෙනස්වීම් පසුබිම් කරගෙන නැවත විධිමත් පරිදි අංශ ස්ථාපිත කිරීමට සිදුවිය. එම කටයුතු වෙනුවෙන් මාස කිහිපයක් ගත වු බැවින් 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට නොහැකි වු අතර හදිසි හා අත්‍යාවශ්‍ය මිලදී ගැනීම් අවස්ථානුකූලව සිදු කළ බව දන්වා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන අනුව, කටයුතු කළ යුතු වීම. |

### 3.1.3 කාර්යභාරයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම හේතුවෙන් ආයතනයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2021 සහ 2022 වර්ෂය තුළ රටේ පැවති සීමාකාරී තත්ත්වයන් මත රාජ්‍ය සේවකයන් චක්‍රීය ක්‍රමයන්ට සේවයට කැඳවීමත්, අත්‍යාවශ්‍ය සේවා කටයුතු අවම සේවක සංඛ්‍යාවක් මඟින් පවත්වා ගෙන යාමත් හේතුවෙන් 2022 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට නොහැකි වූ අතර 2022 දෙවන අර්ධ වර්ෂය තුල ජනාධිපති කාර්යාලයේ සිදුවූ පරිපාලනමය වෙනස්වීම් පසුබිම් කරගෙන නැවත විධිමත් පරිදි අංශ ස්ථාපිත කිරීමට සිදුවිය. ඒ අනුව නව ස්ථාපිත අංශ සම්බන්ධව සැලසුම් සකස් කිරීම සඳහා මාස කිහිපයක් ගත වූ බැවින් 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට නොහැකි වූ බව දනිවා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ **ACA – 6** මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයට රු.47,529,618 ක මූල්‍ය නොවන වත්කම් එකතු කර තිබුණ ද, එම වටිනාකම සනාථ කර ගැනීමට විස්තරය හා උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ACA - 6 මූල්‍ය නොවන වත්කම් වල 2022 ජනවාරි 01 දිනට රු.47,529,618ක ශේෂය ලෙස සඳහන් කර ඇති ස්ථාවර වත්කම් ජනාධිපති මන්දිර වෙතින් අමුද්‍රව්‍ය භාවිතා කර නිර්මාණය කරන ලද්‍ුව, සිගාස් දත්ත පද්ධතිය තුල මූල්‍ය නොවන වත්කම් ලෙස පදනම් වර්ෂයේ ඇතුලත් නොවී තිබුණු වත්කම් වේ. එම නිසා එකී වත්කම් ආරම්භක ශේෂ ලෙස සිගාස් දත්ත පද්ධතිය තුල සෘජුවම ඇතුලත් කරන ලද අතර, භාණ්ඩාගාර ජර්නල් සටහන් හරහා ඇතුලත් කරන ලද වත්කම් නොවන බව දන්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් වෙනස්වීම් පිළිබඳ තොරතුරු පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් රාජ්‍ය ආයතන හා විහාරස්ථාන වෙත මුදාහැර ඇති වාහන 116 ක ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සඳහා ලිපි ලේඛන වර්ෂයකට පෙර භාර දී ඇති නමුත් 2023 අප්‍රේල් මාසය දක්වා ලියාපදිංචි අයිතිය පවරා දී නොතිබුණි. | අංක: BDN-4409, BDN-4412, DAD-1180, KB-9985 හා PH-2913 දරන රථ වල පැවරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති බවත්, අංක RW-6953 දරන රථයේ පැවරීම් කටයුතු සඳහා අදාළ ලිපි ලේඛන මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත් අනෙකුත් වාහන වල ලියාපදිංචි අයිතිය විධිමත්ව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නිරන්තරයෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බවද දන්වා තිබුණි. | ලියාපදිංචි අයිතිය විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වීම හෝ නැවත පවරා ගැනීම කළ යුතු වීම. |
| (ඇ) | භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට නොහැකි ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 51 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පැවැත්ම තහවුරු කර ගැනීමට අසමත් වී තිබුණි. මෙම වාහනවල වටිනාකමක් හෝ සොයා ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම වාහන වල භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර වාහන 51 අතරින් වාහන 28ක භෞතික පැවැත්ම සනාථ කර ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු, රක්ෂණ ආයතන, කොම්ප්ට්‍රොලර් ජනරාල් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධීකරණයෙන් කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | වාහනවල භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | අපහරණය කිරීමට කටයුතු කෙරෙමින් පවතින වාහන 24 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණය කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කෙරෙමින් පවතින වාහන 24 අතරින් වාහන 05ක අපහරණ කටයුතු මේ වන විට අවසන් කර ඇති බවත් වාහන 16කට අදාළව අපහරණ ක්‍රියාවලිය සිදු කරමින් පවතින බවත් අනෙක් වාහන 03 ට අදාල අපහරණ කටයුතු ඉදිරියේදි සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අපහරණ කළ යුතු වාහන අපහරණය කිරීම කඩිනම්ව කළ යුතු වීම. |
| (ඉ) | ජනාධිපති කාර්යාලයට අයත් වාහන 28 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රක්ෂණය කර නොතිබුණි. ඉහත වාහන අතුරින් වාහන 13ක් අධි ආරක්ෂිත රථ බැවින් පිරිවැය සලකා රක්ෂණය කර නොමැති බව සඳහන් කර තිබුණි. මෙම වාහන 13 හි වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර නොතිබුණි. | අධි ආරක්ෂිත හා අනුරූප රථ රක්ෂණයේදී වාහනයේ තක්සේරු වටිනාකම මත ඉතා ඉහළ රක්ෂණ වාරික මුදලක් ගෙවීමට සිදු වේ. අධි ආරක්ෂිත එක් රථයක තක්සේරු වටිනාකම පමණක් රු. මිලියන 250-300ක් පමණ වන අතර එම එක් රථයක් රක්ෂණය කිරීම සඳහා ගෙවිය යුතු වාර්ෂික රක්ෂණ වාරික මුදල රු.මිලියන 17 ඉක්මවන අගයක් වන බව දන්වා තිබුණි. | රටේ පවතින නීති රීති වලට අනුව කටයුතු කළ යුතු වීම හෝ ඉන් බැහැර වන්නේ නම් එම අවශ්‍යතා සැපිරීමට විකල්ප ප්‍රතිපත්තිමය තීරණ හඳුන්වාදීම |

| | | | |
|---|---|---|---|
| (ඊ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ජනාධිපති කාර්යාලය විසින් තාවකාලික පදනම මත වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 52 ක් ලබාගත් බව දන්වා එවා තිබුණද, වාහන 66 ක් භාවිතා කරන බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර නොමැතිවීම හේතුවෙන් ඇතැම් වාහන ජනාධිපති කාර්යාලයට ලබාගත් දිනය ද සොයාගත නොහැකි වී තිබුණි. මෙම වාහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.28,802,245 ක් නඩත්තු වියදම ලෙස ජනාධිපති කාර්යාලය විසින් ගෙවා තිබුණි. | වර්තමානයේ නිත්‍යානුකූල අයිතිය වෙනත් ආයතන සතු වාහන, ජනාධිපති ලේකම් කාර්යාලයේ පරිහරණය සඳහා ලබා ගැනීමේදී තාවකාලික අනුයුක්ත කර ගැනීම් විධිමත් පරිදි සිදු කරනු ලබන බවත්, වාහනවල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීම අනෙකුත් ආයතන වල එකඟතාවය මත පමණක් සිදු කරන බවත් වර්තමානයේදී එලෙස එකඟතාවය ලබා ගත් වාහනවල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු විධිමත් ලෙස සිදු කරනු ලබන බවද ජනාධිපති කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා වෙනත් ආයතන වෙතින් ලබා ගත් වාහන නීත්‍යානුකූලව පැවරීම සිදු නොකළද, නඩත්තු කටයුතු ජනාධිපති කාර්යාලය විසින් සිදු කරනු ලබන බවත් දන්වා තිබුණි. | භාවිතා කරනු ලබන වාහනවල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීම හා විධිමත් ක්‍රමයකට අනුව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (එ) | රජයේ වෙනත් ආයතනවල අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කාර්යාලය සතු වාහන වෙනත් ආයතන හා පුද්ගලයින් වෙත ලබා දී තිබුණ ද, එසේ ලබා දීමේදී ආයතනයේ අරමුණු ඉටුකිරීමට බාධාවක් නොවන පරිදි හා දේපලේ ආරක්ෂාව තහවුරු වන පරිදි විධිමත් අනුමැතියකින්, විධිමත් ක්‍රමවේදයකට වාහන පවරාදීමට කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. පවරා දුන් වාහන වලින් වාහන 12 ක් වාහනය නිදහස් කළ දිනය දක්වා නොතිබුණි. ජනාධිපති කාර්යාලය සතු වාහන 53 ක් වෙනත් රාජ්‍ය ආයතන, විහාරස්ථාන, ආගමික නායකයින් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත නිදහස් කර තිබුණි. එම වාහන අතරින් වාහන 27 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.13,695,119 ක් නඩත්තු වියදම් දරා තිබුණ ද එම වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම වාහන රාජකාරී අවශ්‍යතාවය මත තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇති අතර නිත්‍යානුකූලව පවරාදීමක් සිදු නොකරයි. කෙසේ වුවද අංක KD-6312 හා KV-0281 දරන රථ දෙක නිත්‍යානුකූලව පවරා දීමට කටයුතු කර ඇති බවත්, වෙනත් ආයතන වෙත වාහන ලබා දීමේ දී නිත්‍යානුකූල අයිතිය පවරා දීමක් සිදු නොවන අවස්ථාවල දී සහ රාජකාරී අවශ්‍යතාවය මත පමණක් වාහන ලබා දීම සිදු කර ඇති බැවින් නඩත්තු පිරිවැය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සිදු කර ඇති බවත් දන්වා තිබුණි. | විධිමත් අනුමැතියක් හා ක්‍රමවේදයකට වාහන පවරා දීම හෝ භාවිතයට මුදා හැරීම සිදු කළ යුතු වීම. |

### 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2022 වර්ෂයේදී ඇති වූ කලබලකාරී වාතාවරණය තුළදී ජනාධිපති ලේකම් කාර්යාලය හා කොටුව ජනාධිපති මන්දිරයේ භාණ්ඩ හා උපකරණ සහ වාහනවලට සිදුවී ඇති විගණිත දිනට තක්සේරු කර තිබුණු අලාභහානිවල එකතු වටිනාකම වූ රු.36,675,854 ක් බව නිරීක්ෂණය වූ අතර එය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂය තුල ජනාධිපති ලේකම් කාර්යාලයට, කොටුව ජනාධිපති මන්දිරයට, භාණ්ඩ හා උපකරණ සහ වාහනවලට අරගලකරුවන් විසින් සිදුකර ඇති අලාභහානි සම්බන්ධයෙන් අලාභහානි පිළිබඳ තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත්, පාඩු/අලාභහානි පිළිබඳ මු.රෙ.104 පරික්ෂණ පැවැත්වීම සඳහා 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇති බවත්, පාඩු/අලාභහානි පිළිබඳ විමර්ශන සිදු කිරීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කර ඇති බවත්,<br>වාහනවලට සිදු කර ඇති අලාභහානි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් හා අලාභහානි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් දරන වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇතත්, අවසාන ගිණුම් පිළියෙළ කරන දින වන විටත් නිවැරදි සවිස්තරාත්මක තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලැබී නොමැති වීම, මු.රෙ 104 පරික්ෂණ අවසන් කර නොමැති වීම හා විමර්ශන කටයුතු අවසන් නොවීම නිසා 2022 වර්ෂයේ අවසාන ගිණුම් වල අලාභහානි පිළිබඳ විස්තර පාඩු හා අත්හැරීම් යටතේ හෙළිදරව් කර නොමැති බව දන්වා තිබුණි.<br>2023 වර්ෂයට අදාළ අවසාන මූල්‍ය ප්‍රකාශන තුල පාඩු හා අත්හැරීම් යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | සිදු වූ අලාභහානි, පාඩු හා අත්හැරීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයෙහි හෙළිදරව් කළ යුතු වීම. |
| (ආ) | පැවති කලබලකාරී වාතාවරණය තුළ වාහන 22කට අලාභහානි සිදුවී තිබුණ ද එම වාහන වලින් වාහන 6ක් 2023 මාර්තු 31 දින වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. | අලුත්වැඩියා ඇස්තමේන්තු මඟින් රක්ෂණ සමාගම විසින් අනුමත කර ඇති මුදලින් අදාළ අලුත්වැඩියාවන් සිදු කළ නොහැකි බව අලුත්වැඩියා සිදු කරන ආයතන විසින් දන්වා ඇති බවත් එම නිසා අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇති බවත් දන්වා තිබුණි. | අලුත්වැඩියා කටයුතු සිදු කිරීම හා රක්ෂණ වන්දි ප්‍රතිපූරණය කරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනයට අනුව 2014 සිට 2022 කාල පරිච්ඡේදයට අදාළව රු.25,000ට අඩු වාහන අනතුරු සිද්ධි 51ක් සහ රු.25,000ට වැඩි වාහන අනතුරු සිද්ධි 279ක් සම්බන්ධයෙන් කටයුතු අවසන්වී නොතිබීමේ හේතුවෙන් තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනයමින් පැවතුණි. උක්ත වාහන 279 අතරින් වාහන 235 ක තක්සේරුගත අලාභ වටිනාකම එකතුව රු.54,442,331 ක් වූ අතර වාහන 44 ක අලාභය මේ දක්වා ගණනය කර නොතිබුණි. | හදිසි අනතුරුවලට අදාළව මු.රෙ.104 අනුව අලාභයන් ගණනය කිරීම, විමර්ශන කටයුතු හා පරීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු සිදු කර අලාභ හානි අයකර ගැනීම හා පොත්පත් වලින් ඉවත් කිරීමට කටයුතු සිදු කළ යුතු වීම. |